# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,947 — 1962 මාර්තු 2 වැනි සිකුරාද — 1962.3.2

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 321 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය ... | 317 | මිල පාලන දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 318 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය | 319 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 320 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 325 |
| | | "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 86

අංකය : ඩී. 21/රෙජ්ව/121.

### යුද්ධ හමුදුව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම් සඳහන් නිලධාරී තැන 1962 පෙබරවාරි 20 වැනි දින සිට, යුද්ධ හමුදුවේ නිත්‍ය හට සේනාවෙන් විශ්‍රාම ලබනවා ඇත :—

ලුතිනන් කර්නල් බර්නාර්ඩ් ජස්ටින් විජේමාන්න, ඇම්.බී.ඊ., ඊ.ඩී., ල.යු.පො.සේ.බ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. කයු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 පෙබරවාරි 17 වෙනිදා,
කොළඹ දී ය.

3-67

අංකය : ඩී. 155/රෙජ්ව.

1962 අංක 87

### යුද්ධ හමුදුව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම් සඳහන් නිලධාරී තැන 1962 පෙබරවාරි මස 16 වැනි දින සිට, යුද්ධ හමුදාවේ නිත්‍ය හට සේනාවෙන් විශ්‍රාම ලබා ඇත :—

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) බබා ජුහාර් හජ් බහාර්, ල.පා.හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. කයු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 පෙබරවාරි 18 වෙනිදා,
කොළඹ දී ය.

3-70

සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුද පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

1962 අංක 88

අංකය : ඩී. 1/රෙක්ට්/36.

### යුද්ධ හමුදුව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද කොමිෂන් බලපත්‍ර

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පහත සඳහන් කරන ලද මහත්වරුන් 1961 දෙසැම්බර් මස 21 වෙනි දින සිට පහත දක්වෙන ජ්‍යෙෂ්ඨතා අනු පිළිවෙලට යුද්ධ හමුදාවේ, නිත්‍ය හට සේනාවේ උප ලෙප්ටිනන්ට් වරුන් වශයෙන් කොමිෂන් බලපත්‍ර ලත් ධුරවලට පත්කිරීම සහ ඔවුන්ගේ නම්වලට කෙළින් සඳහන් කර තිබෙන බලකාය/රෙජිමේන්තු වලට ඔවුන් ඇතුලත් කිරීම අනුමත කොට තිබේ :—

කැඩෙට් නිලධාරි යෝගේන්ද්‍ර බාලරත්නරාජා—ලංකා සන්නාහ සන්නද්ධ බලකාය.

කැඩෙට් නිලධාරි ඔව්ඩ් විජිත විජයසේකර—ලංකා සිංහ රෙජිමේන්තුව.

කැඩෙට් නිලධාරි සුසිරිපාල ජිනප්‍රිය වීරසේන—ලංකා ඉංජිනේරු.

කැඩෙට් නිලධාරි සිරිසෝම විජේගුණවර්ධන—ලංකා යුද්ධ හමුදා සේවා බලකාය.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 පෙබරවාරි 10 වෙනිදා,
කොළඹ දී ය.

3-68

---

1962 අංක 89

අංකය : ඩී. 11/රෙක්ට්.

### යුද්ධ හමුදුව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද කොමිෂන් බලපත්‍ර ලත් ධුරයට පත්කිරීමක්

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් 1962 පෙබරවාරි මස 2 වැනි දින සිට පහත නම් සඳහන් කර ඇති වොරන්ට් ඔෆිසර්ව, යුද්ධ හමුදා නිත්‍ය හට සේනාවේ ලුතිනන් (ක්වාටර් මාස්ටර්) කෙනෙකු වශයෙන් කොමිෂන් බලපත්‍ර ලත් ධුරයට පත්කිරීම හා ඔහුගේ නමට ඉදිරියෙන් සඳහන් කර ඇති බලකායට ඇතුලත් කිරිම අනුමත කොට තිබේ :—

එස්/87002 වොරන්ට් ඔෆිසර් I පානාගෙපොල මුදියන්සෙලාගේ රත්නායක—ලංකා යුද්ධ හමුදා යුද්ධායුධ බලකාය.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 පෙබරවාරි 19 වෙනිදා,
කොළඹ දී ය.

3-69

---

1962 අංක 90

අංකය : ඩී. 149/රෙක්ට්.

### රාජකීය ලංකා ගුවන් හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අංශ වෙනස් කිරීමක්

පහත නම් සඳහන් නිලධාරින් ගුවන් සටන් පාලන අංශයේ සිට (ගුවන්) මෙහෙයවීම් අංශයට මාරු කර තිබේ. ඔවුන්ගේ දැනට ඇති ජ්‍යෙෂ්ඨත්වය අළුත් අංශයේදී ද එලෙසම තබා ගන්නවා ඇත.

තාවකාලික බලගණ නායක රාජනායගම් බාලචන්ද්‍රන් (01021)—පීඕ.

බලපංති ලුතිනන් ජෝසප් මොරිස් මිගෙල් ද ආබෲ අබේසිංහ (01027)—පීඕ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 පෙබරවාරි 14 වෙනිදා,
කොළඹ දී ය.

3-71/2

---

1962 අංක 91

අංකය : ඩී. 149/රෙක්ට්.

### රාජකීය ලංකා ගුවන් හමුදුව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අංශ වෙනස් කිරීමක්

පහත නම් සඳහන් නිලධාරින් ගුවන් ගමනාගමන පාලන අංශයේ සිට (ගුවන්) මෙහෙයවීම් අංශයට මාරුකර තිබේ. ඔවුන්ගේ දැනට ඇති ජ්‍යෙෂ්ඨත්වය අළුත් අංශයේදී ද එලෙසම තබා ගන්නවා ඇත.

බලපංති ලුතිනන් අල්පොන්සෝ මරියා ලිකෝරි ජෝන්පුල්ලේ (01046) පීඕ.

බලපංති ලුතිනන් තල්ලතම්බි සංගර පිල්ලේ (01064) පීඕ.

බලපංති ලුතිනන් පසියගලගේ නොයෙල් සරණපාල ප්‍රනාන්දු (01065) පීඕ.

පියසර නිලධාරි ජෝසප් වික්ටර් සොන්සේකා අබේකෝන් (01067) පීඕ.

පියසර නිලධාරි ගුරුසවාමි සෙල්වරාජා (01099) පීඕ.

පියසර නිලධාරි පොන්නම්බලම් ආරියරත්නම් (01101) පීඕ.

පියසර නිලධාරි ඉන්ද්‍රා හේමල් ජයතිලක (01109) පීඕ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 පෙබරවාරි 14 වෙනිදා,
කොළඹ දී ය.

3-71/3

---

1962 අංක 92

අංකය : ඩී. 23/රෙක්ට්/26.

### රාජකීය ලංකා ගුවන් හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද සක්‍රීය සේවා ලැයිස්තුවට මාරුකිරීමක්

1961 දෙසැම්බර් මස 22 වන දින සිට මෙහි පහත නම් සඳහන් නිලධාරියා රාජකීය ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය උප සේවයේ සිට සක්‍රිය සේවා ලැයිස්තුවට මාරු කර තිබේ.

පියසර නිලධාරි අයි. ඒ. ඒ. ද ආබෲ (01032)—සාමාන්‍ය වැඩ/නියමු.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 පෙබරවාරි 16 වෙනිදා,
කොළඹ දී ය.

3-225

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 93

ඒ. 48/62.

1962 පෙබරවාරි මස 15 වැනි දින සිට සිවිල් සේවක කේ. ඇම්. ඩී. ජයනෙත්ති මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුල හෝ නැවත නියමයක් කරන තුරු, හෝ ආණ්ඩුවේ නගර නිර්මාණ ශිල්පී ඇන්. ගුණරත්න මහතා සවකීය රාජකාරිවලට අතිරේකව ජාතික නිවාස කොමසාරිස් තනතුරේ රාජකාරි කටයුතුවල තාවකාලිකව යෙදීමට.

ඒ. 23/61.

1961 දෙසැම්බර් මස 24 වැනි දින සිට නියෝජ්‍ය සර්වේ ජනරාල් ඇස්. කාතිගේසු මහතා සර්වේ ජනරාල් වශයෙන්.

1961 දෙසැම්බර් මස 24 වැනි දින සිට සහකාර සර්වේ ජනරාල් ජේ. සී. චන්මුගම් මහතා නියෝජ්‍ය සර්වේ ජනරාල් වශයෙන්.

ඒ. 27/62.

1962 පෙබරවාරි මස 2 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඩබ්ලිව්. ඇල්. ඊ. ද අල්විස් මහතා සත්වෝද්‍යාන අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්ජ්. එස්. පෝල් මහතා 1962 මාර්තු 1 වැනි දින සිට 4 වැනි දින දක්වා, 11 වැනි හා 12 වැනි දිනයන්හි, මන්නාරමේ, අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයේ, හා මන්නාරමේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : පීඑ්ඒ. මිශ්‍ර/57.

එම්. එම්. පෙරේරා මහතා නැති අතර, එම්. ඒ. ඊ. බී. පෙරේරා මහතා 1962 මාර්තු 15 වැනි හා 28 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධූරයේ වැඩ බැලීමට හා වන්නිහත්පත්තුවේ; කටුගම්පොල හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධූරයේ වැඩ බැලීමට.

අංකය : පීඑ්ඒ. මිශ්‍ර/57.

එම්. එම්. පෙරේරා මහතා නැති අතර, ඒ. ඩබ්ලිව්. ඩී. ඉමැනුවෙල් මහතා 1962 මාර්තු 9 වැනි හා 14 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධූරයේ වැඩ බැලීමට හා වන්නිහත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධූරයේ වැඩ බැලීමට.

අංකය : පීඑ්ඒ/18/57.

ඒ. එල්. එම්. ප්‍රනාන්දු මහතා නැති අතර, බී. පී. පියසේන මහතා 1962 පෙබරවාරි 23 වැනි දින, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, කඩවත් සතරේ, වැලිගම් කෝරළේ ගම්බද උසාවි සභාපති ධූරයේ වැඩ බැලීමට හා ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධූරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 2/50.

ඩී. ඩී. විතාරන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. ගුණසේකර මහතා 1962 පෙබරවාරි 17 වැනි හා 19 වැනි දිනයන්හි, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, වැල්ල බොඩ පත්තුවේ, කඩවත් සතරේ ගම්බද උසාවි සභාපති ධූරයේ වැඩ බැලීමට හා ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධූරයේ වැඩ බැලීමට.

අංකය : පීඑ්ඒ. 36/57.

එම්. ඒ. ඊ. බී. පෙරේරා මහතා 1962 මාර්තු 2 වැනි දින, පිලැස්ස ගම්බද උසාවියේ අංක 1648/පී දරණ අපරාධ නඩුව ඇසීමට, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිලි හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධූරයට.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්ජ්. එස්. පෝල් මහතා 1962 මාර්තු 5 වැනි, 6 වැනි හා 9 වැනි දිනයන්හි, මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්නාරම ගම්බද උසාවි සභාපති ධූරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/අයි. 3/48.

ඩබ්ලිව්. බී. ඉබුල්දෙණිය මහතා නැති අතර, ජේ. ඊ. ගුණසේකර මහතා 1962 පෙබරවාරි 20 වැනි දින, මහනුවර, දිස්ත්‍රික්කයේ, උතුරු මාතලේ ගම්බද උසාවි සභාපති ධූරයේ වැඩ බැලීමට හා නැගෙනහිර මාතලේ ගම්බද උසාවි අතිරේක සභාපති ධූරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එම්. 5/54.

ඊ. එම්. මතියපරනාම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. වී. සේනාතිරාජා මහතා 1962 මාර්තු 1 වැනි දින සිට 3 වැනි දින දක්වා, වවුනියාවේ හා මන්නාරම් දිස්ත්‍රික්කවල, දකුණු වවුනියාවේ ගම්බද උසාවි සභාපති ධූරයේ වැඩ බැලීමට හා මාන්තෙයි ගම්බද උසාවි අතිරේක සභාපති ධූරයේ වැඩ බැලීමට.

එස්. ආර්. විජයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 පෙබරවාරි 23 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ—12.

3-98

# වෙනත් පත්කිරීම් ආදිය

1962 අංක 95

අංකය : ඊබී/ඒ-204/2.

අර්ථ නිරූපන ආඥාපනතේ දෙවන පරිච්ඡේදය 10 බී වැනි වගන්තිය යටතේ අංක 10,123 සහ වර්ෂ 1950 ජූලි මස 14 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද නිවේදනයෙන් තමන් වෙත පැවරී ඇති බලතල අනුව, කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි ස්ථිර ලේකම් විසින් පහත සඳහන් පත්කිරීම් කර ඇති බව මෙන් දැනුම් දෙනු ලැබේ.

යාපනය පාලන දිස්ත්‍රික්කය භාර සම්බන්ධතා නිලධාරී සහ ආණ්ඩුවේ ඒජන්ත තැනගේ විධානය පිට ක්‍රියා කරන එම දිස්ත්‍රික්කයේ වැඩ බලන උප ඒජන්ත, අයි. සමරවික්‍රම මහතා, සවකීය රාජකාරිවලට අතිරේකව, 1962 පෙබරවාරි මස 9 වෙනි දින සිට නැවත නියෝග යක් කරන තුරු යාපනය පාලන දිස්ත්‍රික්කයේ වැඩ බලන රේගු අයකැමි.

ඒ. අයි. මොහිදීන්,
ස්ථිර ලේකම් වෙනුවට.

1962 පෙබරවාරි මස 24 වැනි දින,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය,
කොළඹ 7.

2-131

---

1962 අංක 96

## නිවේදනය

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දිනවල පටන් වලංගු වේ:—

අංකය : 74/2/94 (ඇම් ඇෆ්ජ්).

පී. රනසිංහ මහතා නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ දිසාපති වරයාගේ කාර්යාල සහකාර වශයෙන් 1962 ජනවාරි මස 15 වැනි දින සිට වැඩ බැලීමට.

අංකය : 74/2/37 (ඇම් ඇෆ්ජ්).

ඩබ්ලිව්. පී. දලුවත්ත මහතා 1962 පෙබරවාරි මස 1 වැනි දින සිට මහා භාණ්ඩාගාරයේ සහකාර ආයතන පාලකයකු වශයෙන් වැඩ බැලීමට.

අංකය : 74/2/37 (ඇම් ඇෆ්ජ්).

පී. එල්. ස්කානිවල් මහතා 1962 පෙබරවාරි මස 1 වැනි දින සිට මහා භාණ්ඩාගාරයේ සහකාර ආයතන පාලකයකු වශයෙන් වැඩ බැලීමට.

අංකය : 74/2/37 (ඇම් ඇෆ්ජ්).

ජේ. ජී. ඇල්. පෙරේරා මහතා 1962 පෙබරවාරි මස 1 වැනි දින සිට මහා භාණ්ඩාගාරයේ සහකාර ආයතන පාලකයකු වශයෙන් වැඩ බැලීමට.

අංකය : 74/2/210 (ඇම් ඇෆ්ජ්).

සී. මයිල්වාගනම් මහතා 1962 පෙබරවාරි මස 10 වැනි දින සිට මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

හ. ෂ. අමරසිංහ,
වැඩබලන භාණ්ඩාගාරයේ ලේකම්.

මුදල් අමාත්‍යාංශය,
කොළඹ,
1962 පෙබරවාරි මස 24.

3-133

---

1962 අංක 97

## ගෘහ සේවකයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනත (115 වැනි පරිච්ඡේදය)

වර්ෂ 1947 ලංකා (ස්වාධීනතා) රාජ්‍ය සභා ආඥා පනතේ 8 වන වගන්තිය යටතේ පනවනු ලැබ වර්ෂ 1948 පෙබරවාරි මස 5 වැනි දින අංක 9,828 දරන ආණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ප්‍රකාශයෙන් මඳ වශයෙන් සංශෝධනය කරනු ලැබූ ගෘහ සේවකයින් ලියාපදිංචි කිරීම පිළිබඳ ආඥා පනතේ (115 වෙනි පරිච්ඡේදය) 3 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා ඇමතිතුමන් විසින් ත්‍රිකුණාමලයේ ගෘහ සේවකයින් ලියා පදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තැන වශයෙන් වර්නන් එෆ්ජ්. සොලමන්ස් මහතා වෙනුවට පොලිස් පරීක්ෂක ඊබට් එගොඩපිටිය මහතා 1962.1.1 වැනි දින සිට පත් කරන ලදී.

සී. බී. කුමාරසිංහ,
කම්කරු සහ ජනසතුසේවා අමාත්‍යාංශයේ
අතිරේක ස්ථිර ලේකම්තැන.

1962 පෙබරවාරි මස 22 වැනි දින,
කොළඹ කම්කරු සහ ජනසතුසේවා අමාත්‍යාංශයේදීය.

3-53

1962 අංක 98

එතල්බර්ට් ක්ලැරන්ස් ද සිල්වා සේනාරත්න මහතා බලපිටිය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කම්කරු, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
කම්කරු, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 පෙබරවාරි මස 8 වැනි දින,
කොළඹ දී ය.

3-107

1962 අංක 99

තම්බිදුරෛයි සන්මුගරාසන් මහතා යාපනය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කම්කරු, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
කම්කරු, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 පෙබරවාරි මස 8 වැනි දින,
කොළඹ දී ය.

3-108

## ආණ්ඩුවේ නිවේදන

අංකය : සී. 149/රෙකෝඩ්.

### 1949 අංක 41 දරණ ගුවන් හමුදා පණත

නම වෙනස් කිරීමයි

### ගුවන් සටන් පාලන සහ ගුවන් ගමනාගමන පාලන අංශ, ගුවන් මෙහෙයවීම් අංශය යනුවෙන් නැවත හැඳින්වීම

1949 අංක 41 දරණ ගුවන් හමුදා පණතේ 3 (2) වෙනි වගන්තිය යටතේ රාජකීය ලංකා ගුවන් හමුදාවේ නිලධාරි අංශවල පහත සඳහන් නම් වෙනස් කිරීම අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කර තිබේ :—

ගුවන් හමුදාවේ ගුවන් සටන් පාලන අංශය සහ ගුවන් ගමනාගමන පාලන අංශය "(ගුවන්) මෙහෙයවීම් අංශය" යන අළුත් නමකින් එක අංශයක් ලෙස නැවත සංවිධානය කිරීම.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. කියු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 පෙබරවාරි 14 වෙනිදා,
කොළඹ දී ය.

3-71/1

ඇල්. ඞී.—බී.— 237/30.

### ජනලේඛන ආඥාපනත

ජනලේඛන ආඥාපනතෙහි (143 වෙනි අධිකාරය) 7 වෙනි වගන්තිය යටතේ මුදල් ඇමති වරයා විසින්—

(1) මොනරාගල දිසාපතිගේ අමතර කාර්යාල සහකාර, ස්වකීය නියමිත සේවාවලට අතිරේකව, මොනරාගල දිස්ත්‍රික්කය සඳහා සහකාර ජනලේඛන කොමසාරිස් වරයකු වශයෙන් පත් කර ඇති අතර,

(2) 1961 ඔක්තෝබර් 13 වෙනි දින හා අංක12,717 දරන ගැසට් පත්‍රයෙහි පළ වූ පරිදි මොනරාගල දිසාපතිගේ කාර්යාල සහකාර, මොනරාගල දිස්ත්‍රික්කය සඳහා සහකාර ජනලේඛන කොමසාරිස් වරයකු වශයෙන් පත් කරනු ලැබීම අවලංගු කර ඇත.

හ. ෂ. අමරසිංහ,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 පෙබරවාරි මස 17 වෙනි දින,
කොළඹ දී ය.

1/274

### 1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත

1959 අගෝස්තු 26 වෙනි දින අංක 11,840 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ ආඥාවෙන් සංශෝධිත, 1958 ජූලි 23 වෙනි දින අංක 11,424 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1957 අංක 49 දරණ රජයේ කාර්මික නීති ගත සංස්ථා පනතෙහි 2 වෙනි වගන්තියෙ යටතේ සම්පාදනය කරනු ලැබූ ඒකාබද්ධ ආඥාවෙන් පිහිටුවනු ලැබූ නීතිගත සංස්ථාවක් වූ ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලයෙහි කාර්යයන් සඳහා මෙහි උප ලේඛනයෙහි සඳහන් ඉඩම් පිළිබඳ යෝජිත අත්කර ගැනීම, ඒ පනතේ 33 වෙනි වගන්තිය යටතේ මට පවරනු ලැබූ බලතල ප්‍රකාර කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති මෛත්‍රීපාල සේනානායක වන මම මේ ආඥාවෙන් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති.

කොළඹ, 1962 පෙබරවාරි 14 වෙනි දින,

උප ලේඛනය

උතුරු පළාතේ වවුනියා උතුරු දිස්ත්‍රික්කයේ කුලමුරිප්පු ගමේ පිහිටා ඇති සින්නඩි අප්පුකුට්ටි හිමිකම් කියන දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/857 නොම්මර දරණ (ස.ජ.කා. 1886) සර්වේ ජනරාල් විසින් සකස් කරණ ලද සැලැස්මේ පහත සඳහන් මායිම් වලින් යුක්තවූ 1 වෙනි කැබැල්ල වශයෙන් දක්වා ඇති අක්කර 3ක්වූ (අ. 3, රූ. 0, ප. 0) මුළු ඉඩම් ප්‍රමාණය.

උතුරට : රජයේ කැලෑව ; නැගෙනහිරට : රජයේ කැලෑව සහ දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 (ස.ජ.කා. 1886) දරණ සැලැස්මේ අංක 2 දරණ ඉඩම් කැබැල්ල ; දකුණට : ඇළ සහ දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 (ස.ජ.කා. 1886) දරණ සැලැස මේ අංක 2 දරණ ඉඩම් කැබැල්ල ; බස්නාහිරට : රජයේ කැලෑව සහ ඇළ.

2. උතුරු පළාතේ වවුනියා උතුරු දිස්ත්‍රික්කයේ කුලමුරිප්පු ගමේ පිහිටා ඇති කන්තන් කනපති හිමිකම් කියන දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 (ස.ජ.කා. 1886) සර්වේ ජනරාල් විසින් සකස් කරණ ලද සැලැස්මේ පහත සඳහන් මායිම්වලින් යුක්තවූ 2 වෙනි කැබැල්ල වශයෙන් දක්වා ඇති අක්කර 3ක්වූ (අ. 3, රූ. 0, ප. 0) මුළු ඉඩම් ප්‍රමාණය.

උතුරට : රජයේ කැලෑව ; දකුණට : රජයේ කැලෑව සහ දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 (ස.ජ.කා. 1886) දරණ සැලැස්මේ අංක 3 දරණ ඉඩම් කැබැල්ල ; නැගෙනහිරට : මකරිදමඩු සිට වැටෙන කරත්ත පාර ; බස්නාහිරට : රජයේ කැලෑව සහ දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 (ස.ජ.කා. 1886) දරණ සැලැස්මේ අංක 1 දරණ ඉඩම් කැබැල්ල.

3. උතුරු පළාතේ වවුනියා උතුරු දිස්ත්‍රික්කයේ කුලමුරිප්පු ගමේ පිහිටා ඇති දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 නොම්මර දරණ (ස.ජ.කා. 1886) සර්වේ ජනරාල් විසින් සකස් කරණ ලද සැලැස්මේ පහත සඳහන් මායිම්වලින් යුක්තවූ 3වෙනි කැබැල්ල වශයෙන් දක්වා ඇති අක්කර 3 ක්වූ (අ. 3, රූ. 0, ප. 0) මුළු ඉඩම් ප්‍රමාණය.

උතුරට : දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 (ස.ජ.කා. 1886) දරණ සැලැස්මේ අංක 2 දරණ ඉඩම් කැබැල්ල ; නැගෙනහිරට: කෙරිද මඩු සිට කරත්ත පාර ; දකුණට : දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 (ස.ජ.කා. 1886) දරණ සැලැස්මේ අංක 4 දරණ ඉඩම් කැබැල්ල ; බස්නාහිරට : ඇළ.

4. උතුරු පළාතේ වවුනියා උතුරු දිස්ත්‍රික්කයේ කුලමුරිප්පු ගමේ පිහිටා ඇති දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 නොම්මර දරණ (ස.ජ.කා. 1886) සර්වේ ජනරාල් විසින් සකස් කරණ ලද සැලැස්මේ පහත සඳහන් මායිම්වලින් යුක්තවූ 4වෙනි කැබැල්ල වශයෙන් දක්වා ඇති අක්කර තුනක්වූ (අ. 3, රූ. 0, ප. 0) මුළු ඉඩම් ප්‍රමාණය.

උතුරට : දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 (ස.ජ.කා. 1886) දරණ සැලැස්මේ අංක 3 දරණ ඉඩම් කැබැල්ල ; නැගෙනහිරට : මකරිදමඩු සිට වැටෙන කරත්ත පාර ; දකුණට : දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 (ස.ජ.කා. 1886) දරණ සැලැස්මේ අංක 7 හා 8 දරණ ඉඩම් කැබැලි ; බස්නාහිරට : ඇළ.

5. උතුරු පළාතේ වවුනියා උතුරු දිස්ත්‍රික්කයේ කුලමුරිප්පු ගමේ පිහිටා ඇති දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 නොම්මර දරණ (ස.ජ.කා 1886) සර්වේ ජනරාල් විසින් සකස් කරණ ලද සැලැස්මේ පස්වෙනි (5) කැබැල්ල වශයෙන් දක්වා ඇති අක්කර තුනක්වූ (අ. 3, රූ. 0, ප. 0) මුළු ඉඩම් ප්‍රමාණය :—

උතුරට : ඇළ ; නැගෙනහිරට : ඇළ ; දකුණට : දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 (ස.ජ.කා. 1886) දරණ සැලැස්මේ 6වෙනි කැබැල්ල වශයෙන් දක්වා ඇති ඉඩම් කැබැල්ල.

6. උතුරු පළාතේ වවුනියා උතුරු දිස්ත්‍රික්කයේ කුලමුරිප්පු ගමේ පිහිටා ඇති දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 නොම්මර දරණ (ස.ජ.කා. 1886) සර්වේ ජනරාල් විසින් සකස් කරණ ලද සැලැස්මේ සින්නඩි සින්නතම්බි හිමිකම් කියන පහත සඳහන් මායිම්වලින් යුක්තවූ 6වෙනි කැබැල්ල වශයෙන් දක්වා ඇති අක කර තුනක්වූ (අ. 3, රූ. 0, ප. 0) මුළු ඉඩම් ප්‍රමාණය :—

උතුරට : දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 (ස.ජ.කා. 1886) දරණ සැලැස්මේ අංක 5 දරණ ඉඩම් කැබැල්ල ; නැගෙනහිරට : ඇල සහ යෝජිත පාර ; දකුණට : දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 (ස.ජ.කා. 1886) දරණ සැලැස්මේ අංක 11 දරණ ඉඩම් කැබැල්ල ; බස්නාහිරට : නොච්චි-කාල් අකුල් කැලෑව සහ දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 (ස.ජ.කා. 1886) දරණ සැලැස්මේ අංක 12 දරණ ඉඩම් කැබැල්ල.

සැලැස්මේ ඇප් කැබැල්ල වශයෙන් හඳුන්වා දක්වා ඇති පහත සඳහන් මායිම්වලින් යුක්ත රජයේ මුළු ඉඩම් ප්‍රමාණය :—

උතුරට : කෙරිද මඩු සිට වැටෙන කරත්ත පාර ; නැගෙණහිරට : කෙරිද මඩු සිට වැටෙන කරත්ත පාර හා දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 (ස. ජ. කා. 1886) දරණ සැලැස්මේ අංක 2 දරණ ඉඩම් කැබැල්ල ; දකුණට : ඇළ සහ දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 (ස. ජ. කා. 1886) දරණ සැලැස්මේ අංක 1 දරණ ඉඩම් කැබැල්ල ; බස්නාහිරට : කුරුවිච්චෙයි ආරු.

20. උතුරු පළාතේ වවුනියා උතුරු දිස්ත්‍රික්කයේ කුලමූරිප්පු ගමේ පිහිටා ඇති දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 නොම්මර දරණ (ස. ජ. කා. 1866) සර්වේ ජනරාල් විසින් සකස් කරණ ලද සැලැස්මේ නොච්චි තාල් කැළෑව වශයෙන් දක්වා ඇති නොච්චි තාල් අකුල් කැළෑව වශයෙන් හැඳින් වෙන රජයේ මුළු ඉඩම් ප්‍රමාණය :—

උතුරට : ඇළ සහ කුරුච්චෙයි ආරු ; නැගෙණහිරට : දිසාපතිගේ අංක ඇල්. ඒ. 1790/851 ස. ජ. කා. 1886) දරණ සැලැස්මේ අංක 5, 6, 12, 13, 29, 30, හා 32 දරණ ඉඩම් කැබලි ; බස්නාහිරට : කුරුවිච්චෙයි ආරු.

3-112

---

## දැන්වීමයි

ගම්පහ අධිකරණ කොට්ඨාශය ඇතුලත ඉංග්‍රිසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් ලීලාවතී පල්ලේවෙල සෙනෙවිරත්න සමරවික්‍රම මෙනෙවියට එම අධිකරණ කොට්ඨාශය ඇතුලත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් අවසර දී තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 පෙබරවාරි මස 8 වැනි දින,
කොළඹ දීය.

3-106

---

ඇල්. ඩී.—බී 269/31.

## වන්දනා ගමන් ආඥාපනත

වන්දනා ගමන් ආඥාපනතේ (175 වෙනි අධිකාරය) 2 වෙනි වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර ඇමති තුමා විසින් පනවනු ලැබූ නියෝගය.

මෛත්‍රීපාල සේනානායක,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ
ඇමති.

1962. පෙබරවාරි මස 19 වෙනි දින,
කොළඹ දී ය.

### නියෝග

1961 ජූලි 7 වෙනි දින හා අංක. 12,508 දරන ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ නියෝගයෙන් අන්තිම වරට සංශෝධිත, 1948 අප්‍රේල් මස 30 වෙනි දින හා අංක 9,859 දරන ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ, කතරගම වන්දනා ගමන් සඳහා වූ නියෝග, එහි 22 වෙනි නියෝගයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් නියෝග ඇතුලත් කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"23. උත්සවයක් පවත්නා අතර හෝ උත්සවයකට පෙරාතුවම වූ කාලයකදී මහා දේවාලය පිහිටා ඇති මැණික් ගඟේ ඉවුර පැත්තේ තිබෙන කඳවුරු ප්‍රදේශයට අයත් කොටස ඇතුලත යම් ස්ථානයකදී කෙනකුගේ මරණය සිදු වුවහොත්, ඒ තැනැත්තා ජීවත්ව සිටි නිවසේ ගෘහ මූලිකයා විසින් ඒ මෘතදේහය කඳවුරු ප්‍රදේශයේ ඒ කොටසින් මරණය සිදුවූ අවස්ථාවේ සිට පැය තුනක් ඇතුලත දී ඉවත් කළ යුතු ය; නැතහොත් ඉවත් කරනු ලැබීමට සැලැස්විය යුතුය.

24. උත්සවයක් පවත්නා අතර, මහා දේවාලය පිහිටා ඇති මැණික් ගඟේ ඉවුර පැත්තේ තිබෙන කඳවුරු ප්‍රදේශයට අයත් කොටස ඇතුළත යම් ස්ථානයකට කිසිවකු විසින් මෘතදේහයක් නොගෙන ආ යුතුය ; නැතහොත් ගෙනෙනු ලැබීමට නො සැලැස්විය යුතුය."



## බන්ධනාගාර ආඥා පණත.

වෂී 1939 අංක 53 දරණ ආඥා පණතින් සංශෝධනය කොට වෂී 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥා පණතේ 32 (1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උප ලේඛනයේ 11 වැනි තීරයේ සඳහන් තැනැත්තන්, මෙම දැන්වීමේ සඳහන් දින සිට එක් අවුරුදු කාලය කට, උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකයන් වශයෙන්, කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු
භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවටය.

1962 පෙබරවාරි 19 වැනි දින,
කොළඹ 7,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු
භාර අමාත්‍යාංශය.

### උප ලේඛනය.

| I | II |
|---|---|
| යාපනේ බන්ධනාගාරය. | එස්. එච්. එම්. සාහිදු මහතා. |

3-2

---

## රත්නපුර කෞතුකාගාර උපදේශක සභාව

1942 අංක : 31 දරණ ජාතික කෞතුකාගාර ආඥාපණතේ 5 වන වගන්තිය යටතේ පහත සඳහන් අය 1962 මාර්තු මස 1 වනදා සිට ඉදිරියට තුන් අවුරුදු කාල සීමාවක් සඳහා රත්නපුර කෞතුකාගාර උපදේශක සභාවේ සාමාජිකයින් වශයෙන් කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමති තුමන් විසින් පත් කරනු ලැබ සිටිත්.

(1) එච්. වේරගම මහතා
බස්නායක නිලමේ,
සබරගමුව මහ සමන් දේවාලය,
වේරගම වලව්ව.
උඩනිරිඇල්ල.

(2) පී. බී. වීරසේකර රටේ මහත්මයා,
පැල්මඩුල්ල.

(3) පූජ්‍ය හේන්පිටගෙදර ඥානවංශ හිමි,
බී. ඒ. (ගෞරව) ශ්‍රී සුමන විද්‍යාලය,
වාද්දුව,
රත්නපුර.

ඒ. අයි. මොහිඩීන්,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1962 පෙබරවාරි මස 19 දින,
කොළඹ 7,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු
පිළිබඳ ඇමති කාර්යාලයේ දීය.

3-37

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

කොළඹ 2.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයේ, කොළඹ නගර සභා සීමාව තුළ, දෙමටගොඩ කැටවලමුල්ල පටු මාවතේ පිහිටි අංක 149 දරණ ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 2½ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :

උතුරට : පුද්ගලික ඉඩම් ; නැගෙනහිරට : කානුව ; දකුණට : පුද්ගලික ඉඩම් ; බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස.

3-132

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

පහත පෙනෙන උප ලේඛනයේ සඳහන් නියෝග මවිසින් පිළිගනු ලැබූ බව 1950 අංක 29 දරණ මිළ පනත් 4 වෙනි වගන්තියේ 7 වෙනි අතුරු වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

ඊ. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති.

1962 පෙබරවාරි 19 දින,
කොළඹදී ය.

| දිනය | නියෝගය දුන් බලධාරියා | නියෝගය නිකුත්කරන ලද ද්‍රව්‍ය | නියෝගය පළකරන ලද ගැසට් පත්‍රය |
|---|---|---|---|
| 61.12. 4 ... | පුත්තලමේ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | දුඹුරු සීනි සහ සකස් කළ සුදු සීනි ... | 61.12.13 වෙනි දින අංක 12,823 |
| 61.12. 4 ... | කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක ... | සකස් කළ සුදුසීනි ... | 61.12.7 වෙනි දින අංක 12,796 |
| 61.12. 2 ... | —එම— ... | උම්බලකඩ හෝ බොනිටෝපිෂ් ... | 61.12.7 වෙනි දින අංක 12,796 |
| 61.12. 4 ... | හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක | සකස් කළ සුදුසීනි ... | 61.12. 7 වෙනි දින අංක 12,796 |
| 61.12. 4 ... | හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක | දුඹුරු සීනි ... | 61.12. 7 වෙනි දින අංක 12,796 |
| 61.12. 4 ... | මන්නාරම් දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | සීනි (සකස්කළ සුදු හා දුඹුරු) ... | 61.12. 7 වෙනි දින අංක 12,796 |
| 61.11.29 ... | ත්‍රිකුණාමළ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක | උම්බලකඩ හෝ බොනිටෝ පිෂ් ... | 61.12. 7 වෙනි දින අංක 12,796 |
| 61.12. 4 ... | අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | සකස් කළ සුදුසීනි ... | 61.12. 7 වෙනි දින අංක 12,796 |
| 61.12. 4 ... | වවුනියා දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක ... | සුදුසීනි ... | 61.12. 7 වෙනි දින අංක 12,796 |
| 61.12. 4 ... | රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | සකස් කළ සුදුසීනි ... | 61.12. 7 වෙනි දින අංක 12,796 |
| 61.11.27 ... | වවුනියා දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක ... | සියඹලා සහ උම්බලකඩ හෝ බොනිටෝපිෂ් ... | 61.12. 4 වෙනි දින අංක 12,794 |
| 61.11.27 ... | මඩකලපු දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක... | උම්බලකඩ හෝ බොනිටෝපිෂ් ... | 61.12. 4 වෙනි දින අංක 12,794 |
| 61.11.30 ... | මන්නාරම් දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | උම්බලකඩ හෝ බොනිටෝපිෂ් ... | 61.12. 4 වෙනි දින අංක 12,794 |
| 61.11.16 ... | රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | උම්බලකඩ හෝ බොනිටෝපිෂ් ... | 61.11.22 වෙනි දින අංක 12,779 |
| 61.11.16 ... | ත්‍රිකුණාමළ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක | කරවල හා වියළි ඉස්සෝ ... | 61.11.22 වෙනි දින අංක 12,779 |
| 61.11.13 ... | කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | උම්බලකඩ හෝ බොනිටෝ පිෂ් ... | 61.11.20 වෙනි දින අංක 12,778 |
| 61.11.15 ... | කෑගල්ල දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක... | —එම— ... | 61.11.20 වෙනි දින අංක 12,778 |
| 61.11.14 ... | කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | අතිරේක ආහාර ද්‍රව්‍ය ... | 61.11.20 වෙනි දින අංක 12,778 |
| 61.11.15 ... | හම්බන්තොට දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | උම්බලකඩ හෝ බොනිටෝ පිෂ් ... | 61.11.20 වෙනි දින අංක 12,778 |
| 61.11.14 ... | මහනුවර දිස්ත්‍රික්කයේ හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩ හේවාහැට කොට්ඨාශයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක | —එම— ... | 61.11.20 වෙනි දින අංක 12,778 |
| 61.11.15 ... | නුවරඑළිය දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | —එම— ... | 61.11.20 වෙනි දින අංක 12,778 |
| 61.11. 8 ... | කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක ... | අතිරේක ආහාර ද්‍රව්‍ය ... | 61.11.13 වෙනි දින අංක 12,771 |
| 61.12. 4 ... | මඩකලපු දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක... | දුඹුරු සීනි සහ සකස් කළ සුදුසීනි ... | 61.12.11 වෙනි දින අංක 12,822 |
| 61.12. 4 ... | මාතලේ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක ... | සකස් කළ සුදුසීනි ... | 61.12.11 වෙනි දින අංක 12,822 |
| 61.12. 1 ... | යාපනේ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක ... | උම්බලකඩ හෝ බොනිටෝපිෂ් ... | 61.12.11 වෙනි දින අංක 12,822 |
| 61.12. 4 ... | කළුතර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක ... | සකස් කළ සුදුසීනි ... | 61.12.11 වෙනි දින අංක 12,822 |
| 61.12. 4 ... | ගාලු දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක ... | සීනි (දුඹුරු සහ සකස්කල සුදුසීනි) ... | 61.12.11 වෙනි දින අංක 12,822 |
| 61.12. 5 ... | මාතර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක ... | සීනි (සකස් කළ සුදු) ... | 61.12.11 වෙනි දින අංක 12,822 |
| 61.12. 4 ... | කුරුණෑගල දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර)... පාලක | සුදු සීනි ... | 61.12.11 වෙනි දින අංක 12,822 |
| 61.12. 4 ... | ත්‍රිකුණාමළ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) ... පාලක | එම ... | 61.12.11 වෙනි දින අංක 12,822 |
| 61.12. 5 ... | මාතර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක.... | උම්බලකඩ හෝ බොනිටෝපිෂ් ... | 61.12.11 වෙනි දින අංක 12,822 |
| 61.12. 4 ... | නුවරඑළිය දිස්ත්‍රික්කයේ සහකාරමිළ (ආහාර) පාලක... | සකස් කළ සුදුසීනි ... | 61.12.11 වෙනි දින අංක 12,822 |
| 61.12. 6 ... | අම්පාරේ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාල්ක... | සියඹලා ... | 61.12.11 වෙනි දින අංක 12,822 |
| 61.12. 7 ... | කෑගලු දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක... | සීනි ... | 61.12.11 වෙනි දින අංක 12,822 |
| 61.12. 4 ... | යාපනේ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක... | සකස් කළ සුදුසීනි ... | 61.12.20 වෙනි දින අංක 12,829 |
| 61.12. 4 ... | මහනුවර දිස්ත්‍රික්කයේ හා නුවරඑළියේ උඩ හේවා... හැට කොට්ඨාශයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක... | දුඹුරු සීනි හා සකස්කළ සුදු සීනි ... | එම |
| 61.12. 4 ... | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහකාර මිළ ... (ආහාර) පාලක | එම ... | 61.12.11 වෙනි දින අංක 12,822 |
| 61.11.21 ... | මාතලේ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක... | උම්බලකඩ හෝ —බොනිටෝපිෂ් ... | 61.11.27 වෙනි දින අංක 12,794 |
| 61.11.22 ... | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර)... පාලක | එම ... | 61.11.27 වෙනි දින අංක 12,784 |
| 61.11.17 ... | කළුතර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක ... | එම ... | 61.11.22 වෙනි දින අංක 12,779 |
| 61.11.17 ... | පුත්තලම් දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) ... පාලක | එම ... | 61.11.22 වෙනි දින අංක 12,779 |
| 61.11.28 ... | අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) ... පාලක. | එම ... | 61.12. 4 වෙනි දින අංක 12,794 |
| 61.11.28 ... | බදුල්ල දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක ... | එම ... | එම |
| 61.11.28 ... | මොනරාගල දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | එම ... | එම |
| 61.11.17 ... | පුත්තලම් දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක... | අතිරේක ආහාර ද්‍රව්‍ය ... | 22.11.61 වෙනි දින අංක 12,779 |
| 61.11.13 ... | ගාලු දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක ... | උම්බලකඩ හෝ බොනිටෝපිෂ් ... | 61.11.20 වෙනි දින, අංක 12,778 |
| 61.11.21 ... | මාතර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක ... | එම ... | 61.11.27 වෙනි දින අංක 12,784 |
| 61.11. 4 ... | පුත්තලම් දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක... | දුඹුරු හා සකස්කළ සුදු සීනි ... | 61.12.13 වෙනි දින අංක 12,823 |

### පඩිපාලක සභා ආඥපනත

**නිවේදනයයි**

ගුදිරිකොහු සහ ඇටකෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකු වූ ඩබ්ලිව්. මාක්වාට් මහතා 1962 පෙබරවාරි මස 1 වැනි දින සිට දිවයිනෙන් බැහැර සිටින කාලය තුළදී ඒ මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයකු ලෙස පෙනී සිටීමට පඩි පලාක සභා ආඥපනතේ (136 වැනි අධිකාරය) කම්කරු හා ජනසතුසේවා ගරු ඇමතිවරයා විසින් ජේ. ක්නෝස් මහතා පත්කරන ලද බව 1943 පඩි පාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වැනි ව්‍යවස්ථාව යටතේ මෙසින් නිවේදනය කරනු ලැබේ.

සී. බී. කුමාරසිංහ,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ
අතිරේක ස්ථිර ලේකම්වරයා.

1962 පෙබරවාරි මස 22 වැනි දින,
කොළඹදීය.

3-199

---

### පඩිපාලක සභා ආඥපනත (136 වැනි අධිකාරය)

**නිවේදනයයි**

ගඩොල් හා උළු සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සේවක නියෝජිතයෙකුව සිට පඩිපාලක සභා ආඥපනතෙ '(136 වැනි අධිකාරය) 12 (2) වගන්තිය යටතේ ඉල්ලා අස්වූ හැටියට සැළකෙන ජුසේ මාරි ප්‍රනාන්දු මහතා වෙනුවට පඩිපාලක සභා ආඥපනතේ 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා ඇමතිතුමන් විසින් ඩබ්ලියු. මොසිසෙස් ප්‍රනාන්දු මහතා පත්කළ බව 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වැනි ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. බී. කුමාරසිංහ,
අතිරේක ස්ථිර ලේකම්,
කම්කරු හා ජනසතුසේවා අමාත්‍යාංශය.

1962 පෙබරවාරි 22 වැදි දින,
කොළඹ දීය.

3-143

---

### 1952කේ අංක 12 දරණ සෞඛ්‍ය සේවා පණත

**යාපනයේ ආරෝග්‍යශාලා මණ්ඩලය**

1952 කේ අංක 12 දරණ සෞඛ්‍ය සේවා පණතේ 11 වෙනි වගන්තිය යටතේ 1962 පෙබරවාරි මස 20 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා පී. ආර්. තම්බිඅයියා මහතා යාපනයේ ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ.

එල්. එස්. බී. පෙරේරා,
ස්ථිර ලේකම්.

1962 පෙබරවාරි මස 20 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දිය.

3-148

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### 1946 අංක 32 දරණ වාරිමාර්ග ආඥපනත

මගේ අංකය : එස්. 588.

රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති තැන් පත් ආතර් රාජකුමාර් රත්නවේල් මහතා විසින් 1946යේ අංක 32 දරණ වාරිමාර්ග ආඥපනතේ අංක 113 දරණ වගන්තියේ ප්‍රකාර මා වෙත පවරා ඇති බලතල අනුව, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් ඇම්. බී. සී. සිල්වා වන මට, එකී ආඥපනතේ අංක 15 (1) (ඒ) දරණ වගන්තිය යටතේ පහත දක්වෙන උපලේඛණයෙහි සඳහන් යෝජනාව අනුමත කරමි.

ඇම්. බී. සී. සිල්වා,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්.
රත්නපුර, දිස්ත්‍රික්කය.

#### උපලේඛනය

"වකී 1946 අංක 32 දරණ වාරිමාර්ග ආඥපනතේ 5 වන කොටස අනුව පිළියෙල කරණ ලද රෙගුලාසි අනුව පිහිටුවන ලද, රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්නා කෝරළේ වලල්ගොඩ වසමේ මූල්ඇඩියා වල ගමේ මුල්ඇඩියාවල වැව නමැති සුළු වාරි කර්මාන්තය යටතේ වැඩවන කුඹුරු හිමියන්ගේ මෙම රැස්වීම එම වාරි කර්මාන්තය අනුමත කරයි. තවද එකී වාරි මාර්ග ආඥපණතෙහි 33 (3) (1) දරණ වගන්තිය අනුව මෙම කුඹුරු රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපතිතුමාගේ සතුටට හේතුවන අන්දමට වැඩ කිරීමට මෙම රැස්වීම තීරණය කරයි".

3-56

---

### මහමාරිය—මදුරාසි ප්‍රදේශයේ සේලම් දිස්ත්‍රික්කය

මදුරාසි ප්‍රදේශයේ සේලම් දිස්ත්‍රික්කය, මහමාරිය රෝග ග්‍රස්ථ ප්‍රදේශ මාලාවෙන් ඉවත්කළ බවද, බඩු ගෙන්වීම් සම්බන්ධයෙන් තිබූ බාධක ඉවත්කළ බවද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඊ. ජේ. රත්නායක,
නිරෝධායන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙනුවට.

1962 පෙබරවාරි 23 දින,
කොළඹ, නිරෝධායන කාර්යාලයේ දී ය.

3-252

---

### දැන්වීමයි

බාහිර රෝගීන් අංශයක් මගින් රෝගීන් ඇතුලත් කරගන්නා කොළඹ රෝහල් මණ්ඩලයට අයත් රෝහල් වලට රෝගීන් ඇතුලත් කර ගැනීම සම්බන්ධයෙන්, කොළඹ රෝහල් මණ්ඩලයේ රෝහල් කමිටුව විසින් 1952 අංක 12 දරණ සෞඛ්‍ය සේවා පණතේ 12 (1) (සී) වැනි වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලද පහත සඳහන් නියමයන්, මහජනයාගේ දැනගැනීම පිණිස මෙසේ පළ කරනු ලැබේ.

මවිසින් නිකුත් කරන ලද 1958 මාර්තු 21 දිනැති අංක 11,285 දරණ ගැසට් දැන්වීම මෙයින් අවලංගු කෙරේ.

වී. අ. කරුණාරත්න,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

1962 පෙබරවාරි 21 වැනි දින,
කොළඹ-සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දී ය.

**එකී නියමයන් මෙසේ ය :**

**කොළඹ මණ්ඩලයට අයත් රෝහල් වලට රෝගීන් ඇතුළත් කර ගැනීම**

රෝහලට රෝගීන් ඇතුළත් කර ගැනීම් සියල්ලක්ම පෙරවරු 8 සිට දහවල් 12 දක්වා වූ කාලයේදී බාහිර රෝගීන් අංශය මගින් සිදු කරනු ලැබේ.

නිසි පළාත් බද රෝහලෙන් හෝ දිස්ත්‍රික් රෝහලෙන් හෝ එවනු නොලැබූ පිටපළාත් වල රෝගීන්, පිටපළාත්වල නිසි රෝහල් කරා ආපසු යවනු ලැබීමට ඉඩ තිබේ.

පිට පළාත්වල රෝහල්වලින් එවනු ලබන රෝගීන්ගේ තත්ත්වය අනුව සළකා ඔවුන් රෝහලට ඇතුළත් කිරීම අවශ්‍යයයි ඇතුළත් කරගැනීමේ වෛද්‍ය නිලධාරියා කල්පනා කරතොත්, එබදු රෝගීන් රෝහලට ඇතුළත් කරගනු ලැබේ.

එසේ නොවන රෝගීන්, ප්‍රතිකාර කිරීමේ උපදෙස් සහිතව පිට පළාත් වල නිසි රෝහල් කරා යවනු ලැබේ.

**හදිසි රෝගීන්.**—බාහිර රෝගීන් අංශයේ රෝගීන් බලන වේලා වට, එනම් පෙරවරු 8 සිට දහවල් 12 දක්වා වූ කාලයට පිටස්තරව, රෝහලට හදිසි රෝගීන් ඇතුළත් කර ගනු ලැබේ.

**පොරොත්තු නාමාවලි.**—ශල්‍ය කර්ම සහ වෛද්‍ය ආධාරත්, අනෙකුත් විශේෂඥ ප්‍රතිකාරත් අවශ්‍ය කෙරෙන අයවළුන් උදෙසා පොරොත්තු නාමාවලි තබාගනු ලැබේ.

හදිසි ප්‍රතිකාර අවශ්‍ය නොවන රෝගීන් මෙම පොරොත්තු නාමාවලියන ට ඇතුළත් කරනු ලැබේ. රෝගීන් අයදුම් පත් එවා තිබෙන අනුපිළිවෙල අනුව ප්‍රමුඛත්වය දී ඇඳන් ලැබෙන ලැබෙන පිළිවෙලට ඔවුන්ට ලියුම් මගින් දැනුම් දීමෙන් පසුව ඔවුන් රෝහලට ඇතුළත් කරගනු ලැබේ.

**ඉල්ලීම් සහිත රෝගීන්.**—යම්කිසි නිශ්චිත ශල්‍ය වෛද්‍යවරයෙකුගේ හෝ වෛද්‍යවරයකුගේ හෝ වාට්ටුවට තමා ඇතුළත් කරගන්නා ලෙස, යම් රෝගියෙක් තමා ලියා පදිංචි වන අවස්ථාවේදී

ඉල්ලා සිටියේ නම්, එම වාට්ටුවේ එවකට සිටින රෝගීන් සංඛ්‍යා ව අනුව සලකා එම කාරිය ඉටු කළ හැකි වුවොත්, එම රෝගියා ඔහු ඉල්ලා සිටි වාට්ටුවට ඇතුළත් කර ගනු ලැබේ.

එසේ කළ නොහැකි වුවොත් ඔහු වෙනත් වාට්ටුවකටවත් ඇතුළත් කර ගැනීමට සිදුවේ.

ලියුම්.—පුද්ගලික වෛද්‍යවරයෙකුගෙන් හෝ විශෙෂඥයෙකුගෙන් හෝ රජයේ රෝහලක සේවා මණ්ඩලයට අයත් වෛද්‍යම් නිලධාරියෙකුගෙන් හෝ මහජනයාගෙන් කෙනෙකුගෙන් හෝ රෝගීන් ගෙන එන ලියුම්, සහතික යනාදිය, පළමුව එම රෝගියා පරීක්ෂා කරන්ට යෙදෙන බාහිර රෝගී අංශයේ වෛද්‍ය නිලධාරි තැන වෙත හැම විටම ඉදිරිපත් කළ යුතුය.

3—46

---

## 1938 අංක 51 දරණ සමාගම් ආඥා පනත

**277 (3) වගන්තිය යටතේ සීමාසහිත ලක්දිව (fපිල්ම් ප්‍රොඩියුසර්ස්) නම කපා හැරීමේ දැන්වීම**

1938 අංක 51 දරණ සමාගම් ආඥා පනතේ විධි විධාන යටතේ 1959 ජූනි 19 දින සංස්ථාපිත සමාගමක් වන සීමාසහිත ලක්දිව fපිල්ම් ප්‍රොඩියුසර්ස් ව්‍යාපාරික කටයුතුවල නිරත වී නැති බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නො කිරීමට හේතු නොදක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට සීමා සහිත ලක්දිව fපිල්ම් ප්‍රොඩියුසර්ස් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් වෝල්ටර් මහේස සෙල්ලයියා වන මම, 1938 අංක 51 දරණ සමාගම් ආඥා පනතේ 277 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්.

1962, 2 මස 22 දින,
කොළඹ, වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ
දෙපාර්තමේන්තුවේදී ය.

3-117

---

## දැන්වීමයි

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ කුකුල් කෝරළේ ගලතුර ගම්පති කොට්ඨාශයේ ගවයින් අතර, "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැව් 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පණතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වශී 1961 ඔක්තෝබර 20 දින අංක 12,726 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද, දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1962 පෙබරවාරි 19 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කායඹාලයේදී ය.

3-25

---

## දැන්වීමයි

කෑ/නක්කාවිට සිරිනාලන්දා පිරිවෙණ, ඇරණීයගල.

කෑගලු දිස්ත්‍රික්කයේ අටුළුගම් කෝරළේ නක්කාවිට පිහිටි සිරිනාලන්දා පිරිවෙණ 1. 3. 60 දින සිට අස්ථිර වශයෙන් ලියාපදිංචි කරණ ලෙස පණ්ඩිත නක්කාවිට ධම්මජෝති ස්ථවිරයන් වහන්සේගේ ඉල්ලුම් පත්‍රයක් මෙහි ලැබී තිබේ.

ඊට විරුද්ධව දැන්විය හැකි කරුණු ඇත්නම් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 30ක් ඇතුළත මෙම කායඹාලයට ලැබෙන්ට ලියා එවන මෙන් ඉල්ලමි.

මෙම පිරිවෙණ සම්බන්ධයෙන් 1962. 1. 12 වෙනි දින අංක 12,875 දින දරණ ගැසට් පත්‍රයේ පළවූ අංක ඊ. ඇස්. බී. 14 හා 5. 1. 62 දින දරණ දැන්වීම අවලංගු කළ බව මෙයින් දන්වමි.

එස්. එප්. ද සිල්වා,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

අංක ඊ. එස්. බී. 14,
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය, කොළඹ 2,
1962 පෙබරවාරි මස 23 වැනි දින.
2-134

---

## දැන්වීමයි

මාර/ධම්ධවජ පිරිවෙණ, දෙනියාය

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දෙනියායේ පිහිටි ඉහත සඳහන් පිරිවෙණ රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස ලියාපදිංචි කිරීමට බටාදුරේ ධම්මාලෝක ස්ථවිරයන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ.

මේ දැන්වීම ප්‍රසිද්ධ කළ දිනයේ සිට තිස් දවසක් ඇතුලත මේ ඉල්ලීමට ඉඩ දීමට විරුද්ධතාවයක් ඇතිනම් මා වෙත දැන්විය යුතුය.

ඇස්. ඇප්. ද සිල්වා,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

1962 ක් වූ පෙබරවාරි මස 20 දින,
කොළඹ 2. මැලේ වීදිය,
අධ්‍යාපන දෙපාරතමේන්තුව.

3-11

---

## රථවාහනයන්ට අවහිරවීම

දකුණු කොට්ඨාශය ගාලු දිස්ත්‍රික්කය.

**නයාපාමුල—උනන්විටිය නාගොඩ පාරේ අංක 6/8 දරණ පාලම**

ප්‍රතිසංස්කරණ කටයුතු නිමවන තුරු ඉහත සඳහන් පාලම සියලු රථවාහනයන් උදෙසා 62. 3. 21 වැනි දින සිට මාසයක් වසා තබනු ලැබේ.

උනන්විටිය කැටඹුර ඒ වෙනුවට පාවිච්චි කළ හැකිය.

ටී. ඊ. හේරත්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, රජයේ වැඩ කාර්යාලය.
62. 3. 23

3-142

---

## විශෙෂ නිවේදනයයි

1962 මාර්තු 8 වැනි බ්‍රහස්පතින්ද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1962 මාර්තු 9 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1962 මාර්තු 3 වැනි සෙනසුරාදා පස්වරු 12.30ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1962 මාර්තු 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

### දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන ගාස්තු

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ).

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද, සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක් පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරණ ගාස්තු මෙසේයි :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට | ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරණ දින සිට කාර්යාල්ය වැඩ කරණ දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි. (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).

13. දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | ශ. | | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| එක් කොටසක් ... ... .... | 22 | 50 | ... | 35 | 50 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 12 | 50 | ... | 18 | 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 20 | 0 | ... | 28 | 0 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.

**තනි පිටපත සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. | ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී එක කොටසක් ... | 0 | 25 | ... | 0 | 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... | 0 | 50 | ... | 0 | 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී, 1 වැනි කොටසේ එක් ඡේදයක් ... | 0 | 10 | ... | 0 | 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු I වැනි කොටසෙ එක ඡෙදයක ... ... | 0 | 20 | ... | 0 | 15 |

දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි